තක්සේරු දෙපාර්තමේන්තුව

මුදල් අමාත්‍යාංශය

වාර්ෂික කාර්යසාධන වාර්තාව

2018

තක්සේරු දෙපාර්තමේන්තුව

අංක : 748, මරදාන පාර,
කොළඹ.
0112694381
0112694382
ෆැක්ස් : 0112694383
විද්‍යුත් තැපැල : cv@valuationdept.gov.lk

ගරු මංගල සමරවීර මැතිතුමා
මුදල් අමාත්‍ය

ගරු ඉරාන් වික්‍රමරත්න මැතිතුමා
මුදල් රාජ්‍ය අමාත්‍ය

ආචාර්ය ආර්.එච්.එස්. සමරතුංග මහතා
මහා භාණ්ඩාගාර ලේකම්

පී.ඩී.ඩී.එස්. මුතුකුමාරණ මහත්මිය

රජයේ ප්‍රධාන තක්සේරුකරු

පටුන

I වන කොටස - අප ගැන

පූර්විකාව	03
දෙපාර්තමේන්තුවේ දැක්ම, මෙහෙවර, අරමුණු සහ මූලික වගකීම්	05
අභියෝග හා උපාය මාර්ග	06
දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ක්‍රියාදාමයන්	07

II වන කොටස - කාර්ය සාධනය හා ප්‍රගතිය

ප්‍රාග්ධන තක්සේරු	09
කුලී තක්සේරු	11
ඉලක්කගත - නිම කළ - ප්‍රක්ෂේපිත සාමාන්‍ය තක්සේරු	13
වරිපනම් තක්සේරු	14
වරිපනම් තක්සේරු කටයුතු ආශ්‍රිත ගිණුම්	16
ඉඩම් අත්කර ගැනීමේ සමාලෝචන මණ්ඩලයේ කටයුතු පිළිබඳ ලුහුඩු විස්තරය	18
වත්කම් තක්සේරු කටයුතු පිළිබඳ ලුහුඩු විස්තරය	20
වසර තුල ඉටු කරන ලද විශේෂ ව්‍යාපෘති වල සාරාංශය	21
අධ්‍යාපනික උන්නතිය	25

III වන කොටස - මූල්‍යමය කාර්යකරණය සහ විශ්ලේෂණය

මූල්‍යමය කාර්යකරණය මැනීම සහ වාර්තාකරණය	27

IV වන කොටස - අනුමත සේවක සංඛ්‍යාව හා ශ්‍රම සම්පත

2018 දෙසැම්බර් මස 31 වන දිනට සේවක සංඛ්‍යාව	29

1 වන කොටස - අප ගැන

1. පූර්විකාව

වර්ෂ 1815 දී මෙරට පුරා ව්‍යාප්තව ස්ථාපිත වූ බ්‍රිතාන්‍යයීය පාලනය රටේ ඉඩම් අයිතිය, ඉඩම් පරිහරණය සහ ඉඩම් හිමිකාරිත්වය යන කරුණු රටාව විෂයයෙහි වෙනස්කම් රැගෙන ආවේ ය. 1863 අංක 2 දරන ආඥා පනත " පොදු පරිහරණය පිණිස පුද්ගලික ඉඩම්වල සන්තකය ලබා ගැනීමටත්, ඉඩම් මැන සමීක්ෂණය කර තක්සේරු කිරීමටත් කිරීටයට හැකි වන්නා වූ ආඥා පනතකි." යනුවෙන් නීතිමය හිමිකම් පවරා ගත්තේ ය.රජයේ දේපළ වල වාර්ෂික තක්සේරුවක් කිරීමටත්, නාගරික ප්‍රදේශවල පිහිටි නිශ්චල දේපළ තක්සේරු කිරීමටත්, ඉඩම් වලට අදාළ වෙනත් තක්සේරු කටයුතු කිරීමටත් 1921 ජූනි මස 1 වන දින පළාත් පාලන මණ්ඩලයක් පිහිටුවන ලදි. රජයේ තක්සේරුකරු තනතුර සහ ඔහුගේ කාර්ය මණ්ඩලය සඳහා වූ ප්‍රතිපාදන පළාත් පාලන මණ්ඩලය යටතේ වෙන් කරන ලද අතර කිරීටය සතු දේපළ තක්සේරු කිරීම, බූදල් බදු අගයා තක්සේරු කිරීම සහ ප්‍රාදේශීය බල මණ්ඩලවලට අයත් ඉඩම් අත්පත් කර ගැනීම හා ඒවා අගයා තක්සේරු කිරීම යනාදී කාර්යයන් භාරව කටයුතු කරනු පිණිස රජයේ තක්සේරුකරු තනතුර 1923 වර්ෂයේ දී ඇති කරන ලදි.

වර්ෂ 1939 දී, භාණ්ඩාගාරයේ තක්සේරු අංශය සහ පළාත් පාලන තක්සේරුකරුවන්ගේ දෙපාර්තමේන්තුව යනුවෙන් වූ ආයතන දෙකක් රජය වෙනුවෙන් තක්සේරු කටයුතු වල නිරතව සිටියේ ය. වියදම් කපා හැරීමේ ක්‍රියා මාර්ගයක් ලෙස ඉහත සඳහන් ඒකක දෙක ඒකාබද්ධ කර අභිනව දෙපාර්තමේන්තුවක් යටතේ එක් නිලධරයෙකු භාරයේ තැබීමට තීරණය කෙරුණු අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් 1939 ඔක්තෝබර් මාසයේ දී ප්‍රධාන තක්සේරුකරු ලෙස කපිතාන් ඊ.ජී. ඊස්ට්මන් මහතා පත් කරනු ලැබිණි.

මෙම කාලය අතරතුර තක්සේරු කටයුතු ක්ෂේත්‍රයේ වෘත්තීයමය තත්ත්වය ඔසවා තැබීමේ අරමුණ පෙරදැරිව තක්සේරුකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් ලංකා කාර්මික විද්‍යාලයෙහි ආරම්භ කරන ලදි. තක්සේරුකරුවන් සඳහා වූ වෘත්තීය අධ්‍යයන පාඨමාලාවක් වන දේපළ කළමනාකරණය පිළිබඳ උපාධිය 1972 දී කොළඹ විශ්ව විද්‍යාලයෙන් ආරම්භ කර, පසුව ඊළඟ වර්ෂයේ සිට එම උපාධිය විද්‍යෝදය විශ්ව විද්‍යාලයෙහි ද (දැනට ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය) ඉගැන්වීම ඇරඹිණි. අද වන විට ද, තක්සේරු දෙපාර්තමේන්තුවට වෘත්තිකයන් බිහි කර දෙන ප්‍රධාන ප්‍රභවය වන්නේ මෙයයි. දෙපාර්තමේන්තුවට කෙරෙන මූලික බඳවා ගැනීම් හී මට්ටම උපාධි මට්ටම දක්වා ඉහළ දැමුනු අතර මේ වන විට දෙපාර්තමේන්තුවට බඳවා ගනු ලබන්නේ දේපළ කළමනාකරණය හා තක්සේරුකරණය පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධිය දරන්නන් පමණි.

රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව මෙරට සමාජ ආර්ථික සංවර්ධන ක්‍රියාවලියට සුවිශේෂී දායකත්වයක් සපයන බව පොදු මහජනතාව විෂයෙහි ප්‍රකට කරුණකි. වසර 95 කටත් අධික ඉතිහාසයක් සපුරා සිටි අපගේ පූර්වානුගාමිකයෝ ඔවුන්ගේ විචක්ෂණ දැනුම හා ප්‍රගුණතාව සමගින් තක්සේරුකරණය හා දේපළ කළමනාකරණය පිළිබඳ සම්ප්‍රදායන් සහ උසස් ප්‍රමිතීන් පවත්වා ගනු ලබන රාජ්‍ය අංශය තුළ පවත්නා කීර්තිමත් වෘත්තීය ආයතනයක් අප වෙත උරුම කර තබා ගියහ.ඔවුන් සිය කැපවීම තුළින් හා නිසි ගරුත්වය සහ අධි වෘත්තීය භාවය මතින් ගොඩ නැගූ ක්‍රමවේදයන් ඔස්සේ අප හට විද්‍යාමාන කරනුයේ, සේවා සැපයීමෙහිලා වෘත්තීය මට්ටමේ හා ඉහළම ගණයේ තක්සේරුකරුවන් ලෙස කෙතරම් විශිෂ්ට අයුරින් අප කටයුතු කළ යුතු ද යන්නයි.

මෙම කාර්ය සාධන හා ගිණුම් දැක්වීමේ වාර්තාව, අප තක්සේරු දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන සැලැස්මෙහි නියම කරනු ලැබ ඇති ඉලක්ක හා අරමුණු එල්ලේ තථ්‍ය ප්‍රතිඵල සංසන්දනාත්මකව දැක්වෙන එහි පරමාර්ථ හා කර්තව්‍යයන් ද, එහි කාර්ය සාධන ක්‍රියා මාර්ගවල හා ප්‍රගතියේ සුවිශේෂ අවස්ථා ද විදහා දැක්වෙන පූර්විකාවේ කූඨ ප්‍රාප්තියයි. එම කටයුතු, මෙරට සමාජ ආර්ථික සංවර්ධනය උදෙසාත්, දෙපාර්තමේන්තුවේ මූල්‍ය කළමනාකරණ ක්‍රියාවලිය උදෙසාත් දායක කරගනු පිණිස සහය සලසා ගැනීමේ අටියෙන් දෙපාර්තමේන්තුව විසින් ඉටු කරන ලද කාර්යයන් වන්නේ ය. අදාළ සැලසුම් උපායමාර්ග නොකඩවා ඉටු කිරීම ආරම්භ කරමින් ශ්‍රී ලංකා මුදල් අමාත්‍යාංශය යටතේ ස්වකීය අය වැය ලේඛනය ක්‍රමානුයෝජනය, එහි වැඩ ඉටු කිරීම හා ඊට සාධාරණය සැලසෙන අයුරින් කටයුතු කිරීම යන කාර්යයන් තක්සේරු දෙපාර්තමේන්තුව ඉෂ්ට සිද්ධ කළේය. මෙම වාර්තාව පිළියෙළ කෙරෙනුයේ ශ්‍රී ලංකා රජයේ මුදල් රෙගුලාසිවලට අයත් නියමයන්ට අනුකූලව වන අතර 2018 වර්ෂය තුළ තක්සේරු දෙපාර්තමේන්තුවේ කාර්ය කටයුතු මින් ආවරණය කරනු ලැබේ.

1. දෙපාර්තමේන්තුවේ දැක්ම, මෙහෙවර, අරමුණ සහ මූලික වගකීම්

“අපගේ දැක්ම”

“නිශ්චල දේපළ තක්සේරුකරණ සහ කළමනාකරණ විෂයයෙහිලා ගෝලීය ප්‍රමිතීන් පදනම් වූ ප්‍රශස්ත වෘත්තීයමය සේවාවන් තුළින් සමාජ ආර්ථික සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම”

“අපගේ මෙහෙවර”

“කාර්යක්ෂම හා ඵලදායි කළමනාකරණ ව්‍යුහයක් තුළින් තරඟකාරීව මෙන්ම පිරිවැය පිළිබඳ සවිඥාණිකව ශ්‍රී ලංකා රජයට පූර්ණ වෘත්තීයමය තක්සේරු හා දේපළ කළමනාකරණ සේවාවන් සැපයීම.”

“අපගේ අරමුණ”

“මෙම දෙපාර්තමේන්තුවේ අරමුණු වනුයේ සේවාදායකයින් වෙත ප්‍රතිඵල සාධනය ඉලක්ක කරගත් විශිෂ්ටතම කාර්ය චර්යා ප්‍රමිතීන් මත පිහිටා උසස් වෘත්තීයමය සේවාවන් සැපයීමයි.”

අපගේ මූලික වගකීම්

“තක්සේරු දෙපාර්තමේන්තුව, තම ව්‍යවස්ථාපිත වගකීම් හැරුණු විට, රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන උදෙසා විස්තීර්ණ තක්සේරු සේවාවන් හා දේපළ කළමනාකරණ සේවාවන් සැපයීමේ වගකීම උසුලයි.”

2. අභියෝග හා උපායමාර්ග

මෙම අංශය විෂයයෙහි ගෙනහැර දක්වනු ලබන අභියෝග හා උපාය මාර්ග, තක්සේරුකරණයේ ක්‍රම සහ මූල්‍ය වර්තාකරණය යන කරුණු සම්බන්ධයෙන් වන්නාවූ අභ්‍යන්තර පාලනයේ කාර්යක්ෂමතාව පිළිබඳ තක්සේරුවක් සිදු කරන ලදී. එම ප්‍රයත්නය තුළින්, අදාළ දුර්වලතා පිටු දැක නිසි ගිණුම්කරණමය හා වාර්තාකරණමය කාර්ය සාධනයක් සහතික වනු පිණිස නිවැරදි හා කාර්යක්ෂම ක්‍රියාකාරී සැලසුම් ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය කිරීම තුළින් ඒවා වැඩිදියුණු කිරීමේ ක්‍රියාදාමය අඛණ්ඩව පවත්වා ගැනේ. සමාලෝචිත 2017 වසර මුළුල්ලේම තක්සේරු දෙපාර්තමේන්තුව ස්වකීය කාර්ය සාධන දත්ත අදාළ වසර තුළ ඉටුකරන ලද තක්සේරු කිරීම් මත පිහිටා විශ්ලේෂණයට හසු කිරීම මගින් ආයතනයේ කාර්යක්ෂමතාව හා ඵලදායිතාව මැන බලන අතර දෙපාර්තමේන්තුවේ තක්සේරුකරණ කාර්ය සාධන ක්ෂේත්‍රය තුළ උද්ගත වන අඩුපාඩු හඳුනා ගනිමින් ඒවා පිටු දැකීම සඳහා අවශ්‍ය වන්නාවූ ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග හඳුනා ගැනීම පිණිස මෙම දත්ත උපයෝගි කර ගනියි.

අප විසින් සලසා දෙනු ලබන සේවය ප්‍රධාන වශයෙන් කළමනාකරණයේ ඵලදායිතා හා කාර්යක්ෂමතා මට්ටම කෙරෙහි අනුගතව පවතී. අපගේ හරාත්මක නීතිමය බලසීමා සම්බන්ධයෙන් ප්‍රති අවධානය යොමු කෙරෙන විධිමත් අගැයුම් උපාය මාර්ග සංවර්ධනය කරගැනීම පිණිස වූ අප ආයතනය සතු හැකියාව මීට හේතු කාරක වන්නේය. අපගේ ශක්තීන්, දුර්වලතා, අවස්ථා හා තර්ජන පිළිබඳව විශ්ලේෂණය කෙරෙන නිසි හා විධිමත් කාර්ය සාධන අගැයුම් ක්‍රමවේදයක් නොමැති වීම අද දින ප්‍රමුඛ ගැටලුවක් බවට පත්ව තිබේ.

අපගේ කාර්ය සාධනය ඉහළ නංවා ගැනීමේ අරමුණ පෙරදැරිව අපගේ අභ්‍යන්තර හා බාහිර දක්ෂතා, අභියෝගතා, අවස්ථා හා තර්ජන අගැයුමට ලක්කිරීම මගින් අප ආයතනය සම්බන්ධයෙන් කරුණු මැන බැලීම ඉලක්ක කර ගත් සංවිධානමය කළමනාකණ ක්‍රමවේදයක් පිළිබඳව සාපේක්ෂ වශයෙන් වූ අභිනව සංකල්පයක් අප විසින් උපයෝගි කරගනු ලැබිය යුතු වන්නේය. ප්‍රමුඛ වශයෙන්, වඩා ශක්තිමත් ක්ෂේත්‍ර හා වැඩිමනත් අවස්ථා පවත්නා ක්ෂේත්‍ර වෙත අපගේ ක්‍රියාදාමය යොමු කිරීමට අපට පුළුවන. තක්සේරුකරණය හා දේපළ කළමනාකරණය යන ක්‍රියාදාම පරාසය තුළ රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතනවලට සේවා සලසන අද්විතීය රාජ්‍ය ආයතනයක් වන අප ඉදිරියේ පුළුල් වෙළඳපළක් ඒ සඳහා විවෘතව පවතී.

දෙපාර්තමේන්තුව තුළ ප්‍රමුඛ ස්ථරවල සුදුසු කාර්ය මණ්ඩල සේවයෙහි නිරතව සිටීම අප සතු මහඟු වත්කමකි. දෙපාර්තමේන්තුවේ තක්සේරු සේවක මණ්ඩලය ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ දේපළ කළමනාකරණය සහ තක්ස්රුකරණය පිළිබඳ විශේෂ උපාධිධාරීන් වන අතර නව ප්‍රගුණතා අනුව කටයුතු කිරීම සඳහා සියලුම සේවක කාර්යමණ්ඩල අවශ්‍ය දැනුමෙන් හා නිපුණතවයෙන් පරිපූර්ණව සිටිති. ඉතා

ඉහළ වෘත්තීමය තත්වයක් ලඟාකරගැනීමට හැකි වනු පිණිස රාජකීය වරලත් මිනින්දෝරු ආයතනයේ අඛණ්ඩ වෘත්තීය සංවර්ධන නියෝග අනුව කටයුතු කරමින් ස්වකීය සේවා කාලය තුල අවශ්‍ය වන්නාවූ දැනුම හා ප්‍රවීණතාවය යාවත්කාලීන කරගනු සඳහා රාජකීය වරලත් මිනින්දෝරු ආයතනයේ ආශ්‍රය සාමාජිකත්වය ලබා ගැනීම උදෙසා තක්සේරු දෙපාර්තමේන්තුව විසින් කඩිනම් මාර්ගයක් අදාළ කාර්ය මණ්ඩල වෙත සලසා දී තිබේ. මෙම විශ්ව විද්‍යාල ආයතනයේම දේපළ කළමනාකරණය හා තක්සේරුකරණය පිළිබඳ පශ්චාත් උපාධිය හැදෑරීම සඳහා දිස්ත්‍රික් තක්සේරුකරුවනට හා සහකාර දිස්ත්‍රික් තක්සේරුකරුවනට මෙම දෙපාර්තමේන්තුව විසින් අවශ්‍ය අරමුදල් ද සපයා දී තිබේ. තක්සේරුකරණය පිළිබඳව ස්වකීය දැනුම යාවත්කාලීන කර ගනු පිණිස තක්සේරු කාර්ය මණ්ඩලය උදෙසා ධාරිතා වර්ධන වැඩසටහන් ද කලින් කල පවත්වනු ලැබේ.

3. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ක්‍රියාදාමයන්

දේපළ කළමනාකරණය හා තක්සේරුකරණය සම්බන්ධයෙන් පළාත් සභා සහ පළාත් පාලන ආයතන ඇතුළුව රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන සඳහා දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන සේවාවන් ප්‍රධාන වශයෙන් පහත සඳහන් අයුරින් වර්ගීකරණය කළ හැකි ය.

(අ) ඉඩම් අත්කරගැනීමේ පනත යටතේ පුද්ගලික දේපළ පොදු කටයුතු සඳහා වූ අනිවාර්ය අත්කර ගැනීම් වලදී, එම පනත යටතේ ගෙවිය යුතු වන්දි සඳහා තක්සේරු වාර්තා පිළියෙළ කිරීම.

(ආ) ඉඩම් අත්කරගැනීමේ පනතේ 38 (අ) වගන්තිය යටතේ හදිසි සංවර්ධන කාර්ය කටයුතු උදෙසා අත්කර ගනු ලබන ඉඩම් සඳහා තත්ත්ව වාර්තා පිළියෙළ කිරීම.

තක්සේරු දෙපාර්තමේන්තුව, රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතනවල සුවිශේෂී ආකාරයේ දැවැන්ත ව්‍යාපෘති වෙනුවෙන් මහ පරිමාණ තක්සේරු කිරීම් ඉටුකර දීම මගින් සුවිශාල මට්ටමේ පරිපූර්ණ වෘත්තීය තක්සේරු හා දේපළ කළමනාකරණ සේවයක් සැපයීමෙහි නියැලී සිටියේ ය.

(ඇ) ඉඩම් අත්පත් කර ගැනීමේ පනත යටතේ යථා කාලයේදී කෙරෙන දේපළ අත්කරගැනීම් සඳහා වන්දිමුදල් ප්‍රතිපාදනයන් වෙන්කර ගැනීම උදෙසා දේපළ ඇස්තමේන්තු තක්සේරු පිළියෙළ කිරීම.

(ඈ) පුද්ගලික ගිවිසුම් මත දේපළ මිලදී ගැනීම සහ සන්තකය බැහැර කිරීම, ගිණුම් කටයුතු මෙන්ම බදු කාර්යයන් උදෙසා සහ වෙනත් විවිධ කාර්යයන් සඳහා චංචල හා නිශ්චල දේපළ තක්සේරු කිරීම.

(ඉ) අල්ලස් පනත සහ ඉඩම් ප්‍රතිසංස්කරණ පනත වැනි ව්‍යවස්ථාමය ප්‍රතිපාදන යටතේ බලය ලබා දී ඇති තක්සේරු කිරීම් සිදු කරන ලෙස ප්‍රධාන තක්සේරුකරු හට නියම වූ විට අදාළ දේපළ තක්සේරු කිරීම.

(ඊ) රජයේ හා රාජ්‍ය ආයතනවල දේපළ කුලියට දීම සහ පුද්ගලික දේපළ රජයට සහ රාජ්‍ය අනුබද්ධ ආයතනවල පරිහරණය හා වාසය සඳහා අවශ්‍ය වූ විට, ඒ සඳහා කුලී තක්සේරු සපයනු ලැබේ.

(උ) කොළඹ මහනගර සභා සීමාව තුළ පිහිටි දේපළ හැර දිවයිනේ වරිපනම් බදු අය කෙරෙන සියලුම පළාත් පාලන ආයතනයන්ට අයත් දේපළ, ප්‍රාදේශීය වරිපනම් බදු අයකිරීමේ කාර්යය උදෙසා තක්සේරු කරනු ලබන අතර, අතෘප්තිමත් පුද්ගලයින් විසින් වරිපනම් තක්සේරු වලට එරෙහිව ඉදිරිපත් කෙරෙන විරෝධතා පිළිබඳ නිශ්චය කිරීමේ දී වෘත්තීය සහය දැක්වීම මෙම දෙපාර්තමේන්තුව විසින් සිදුකරනු ලැබේ.

(ඌ) විශේෂයෙන් ශ්‍රී ලංකා විනිමය සුරැකුම්පත් කොමිෂන් සභාව හා ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය වැනි ආයතන වෙත වත්කම් තක්සේරුකරණය හා නිශ්චල දේපළ කළමනාකරණ කටයුතු පිළිබඳ උපදේශක සේවාවන් සැපයීම හා එම අංශයන්හි වෘත්තීය නිපුණතාවය වැඩිදියුණු කිරීම උදෙසා අවශ්‍ය කටයුතු සැලසීම.

(එ) වන්දි මුදල් හා තක්සේරු ආරවුල් විභාග කර විසඳුම් ලබා දෙන අධිකරණවලට හා විවිධ වන්දි විනිශ්චය සභාවලට විශේෂඥ සාක්ෂ්‍ය සැපයීම මගින් සහය වන අතර දෙපාර්තමේන්තු නිලධාරීන්, ප්‍රධාන තක්සේරුකරු නියෝජනය කරමින් ගෙවල් කුලී පනත යටතේ ස්ථාපිත ගෙවල් කුලී මණ්ඩලවල (කොළඹ මහ නගරසභා සීමා බල ප්‍රදේශය තුළ හැර) රැස්වීම්වලට නිල බලය ලත් සාමජිකයන් වශයෙන් සහභාගී වේ.

(ඒ) මහ භාණ්ඩාගාරයේ ඉල්ලීම මත, රාජ්‍ය ව්‍යවසායන් සඳහා ව්‍යාපාර තක්සේරු කටයුතු ද සිදුකරනු ලැබේ.

(ඔ) කොළඹ මහ නගර සභා සීමාව තුළ පිහිටි කිරීටය සතු දේපළවල වාර්ෂික වටිනාකම් ප්‍රධාන තක්සේරුකරුගේ අනුමැතිය සහිතව කොළඹ මහ නගර සභාව විසින් තක්සේරු කරනු ලැබේ.

(ඕ) රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතනවල ගිණුම්කරණ කාර්යයන් සඳහා වත්කම් තක්සේරු කිරීම.

(ක) ආපදා කළමනාකරණ තත්ත්ව කාර්යයන් යටතේ වන්දි තක්සේරු කිරීම.

II වන කොටස - කාර්යසාධනය සහ ප්‍රගතිය

4. ප්‍රාග්ධන තක්සේරු

i. <u>**1950 අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ තක්සේරු කිරීම්**</u>

අ) ඉඩම් අත්කරගැනීමේ පනත යටතේ ඉඩම් අත්කර ගැනීමට නියමිත අවස්ථාවල දී ගෙවිය යුතු වන්දි වෙන්කිරීම් සඳහා තක්සේරු පිළියෙළ කිරීම.

1950 අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අත්කර ගැනීමට යෝජිත ඉඩම්වලට අදාළ අරමුදල් වෙන්කර ගැනීම සඳහා දේපළ ඒකක 970 ක ඇස්තමේන්තු තක්සේරු කටයුතු 2018 වර්ෂය තුළදී නිම කරන ලදි.

ආ) ඉඩම් අත්කරගැනීමේ පනතේ 38 (අ) වගන්තිය යටතේ හදිසි සංවර්ධන කාර්ය කටයුතු උදෙසා අත්කර ගනු ලබන ඉඩම් සඳහා තත්ත්ව වාර්තා පිළියෙළ කිරීම.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 (අ) වන වගන්තිය යටතේ සන්තකය රජය වෙත පවරා දෙනු ලැබ ඇති ඉඩම් සම්බන්ධයෙන් තත්ත්ව වාර්තා 5,243 ක ප්‍රමාණයක් පිළියෙළ කරනු ලැබ තිබේ.

ඇ) ඉඩම් අත්කරගැනීමේ පනත යටතේ පොදු කාර්ය කටයුතු සඳහා අනිවාර්යයෙන් ම ඉඩම් අත්කර ගනු ලැබ ඇති සම්බන්ධිත පාර්ශව සඳහා ගෙවිය යුතු වන්දි පිළිබඳව වූ තක්සේරු කිරීම් පිළියෙළ කිරීම.

අත්කර ගැනීමේ නිලධාරින් විසින් ඉඩම් අත්කර ගැනීමේ පනතේ 17 (1) වන වගන්තිය අනුව කළ යුතු වන්දි ප්‍රදානයන් උදෙසා දේපළ ඒකක 19,454 ක් වෙනුවෙන් වූ තක්සේරු කිරීමේ කටයුතු 2018 වර්ෂය තුළ දී දෙපාර්තමේන්තුව විසින් නිම කරනු ලැබ තිබේ.



ii. <u>විවිධ කාර්යයන් සඳහා නිශ්චල හා චංචල දේපළ තක්සේරු කිරීම</u>

 අ) දිගු කාලීන හා කෙටි කාලීන බදුකර සඳහා රජයේ ඉඩම් තක්සේරු කිරීම.

ආ) ගිණුම්කරණ කාර්යයන් සඳහා රාජ්‍ය හා ආයතනික වත්කම් තක්සේරු කිරීම.

ඇ) පුද්ගලික ගිවිසුම් යටතේ දේපළ මිලදී ගැනීම සහ සන්තකය බැහැර කිරීම.

ඈ)දෙපාර්තමේන්තුව, වන්දි මුදල් හා තක්සේරු ආරවුල් විභාග කර තීරණ ලබා දෙන අධිකරණවලට හා විවිධ වන්දි විනිශ්චය සභාවලට විශේෂඥ සාක්ෂ්‍ය සැපයීම මගින් සහය වේ.

රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතනවල වත්කම් තක්සේරු කිරීමේ කටයුතු ඇතුළුව දේපළ ඒකක 46198 කට අයත් විවිධ තක්සේරු කිරීම් ප්‍රමාණයක් 2018 වර්ෂය තුළ දී දෙපාර්තමේන්තුව විසින් නිම කරනු ලැබ තිබේ.



iii. <u>අල්ලස් පනත යටතේ තක්සේරු කිරීම්</u>

2018 වර්ෂය තුළ දී දෙපාර්තමේන්තුව විසින් අල්ලස් කොමසාරිස් වරයා වෙත දේපළ ඒකක 15 කට අයත් තක්සේරු කිරීම් ප්‍රමාණයක් වාර්තා කරනු ලැබ තිබේ.

iv. <u>මුද්දර බදු යටතේ තක්සේරු කිරීම්</u>

මුද්දර බදු කාර්යයන් සඳහා දේපළ ඒකක 132 ක ප්‍රමාණයක් තක්සේරු කරනු ලැබ තිබේ.

5. කුලී තක්සේරු කිරීම්

i. <u>රජයේ දේපළ සම්බන්ධයෙන් මාසික කුලී තීරණය කිරීම</u>

2018 වර්ෂය තුළ දී, දේපළ 9,184 කට අයත් කුලී තක්සේරු කිරීම් ප්‍රමාණයක් රජයට සහ අනෙකුත් ආයතන වෙත, ඔවුන්ගේ දේපළ හිමිකම් කුලියට දීමට හඳුනා ගනු ලැබ ඇති අවස්ථාවල දී හෝ එසේ නැතහොත්, එකී ආයතනවලට ස්වකීය පරිහරණය හා වාසය පිණිස පුද්ගලික දේපළ අවැසි වන අවස්ථාවල දී හෝ, සපයනු ලැබ තිබේ.

ii. <u>ආයතන සංග්‍රහය යටතේ රජයේ නිවාස සඳහා ආර්ථික කුලී</u>

ආයතන සංග්‍රහයේ XIX වන පරිච්ඡේදයේ 5.1 සහ 7.1 වගන්ති අනුව, 2018 වර්ෂය තුළ දී, දේපළ 5,949 ක් සම්බන්ධයෙන් වූ ආර්ථික කුලී හා දණ්ඩන කුලී පිළිබඳව වාර්තා කරනු ලැබ තිබේ.

නිම කළ සාමාන්‍ය තක්සේරු කිරීම් - වර්ෂමය හා ප්‍රක්ෂේපිත

තක්සේරු වර්ගය	2014	2015	2016	2017	2018	2019
තත්ත්ව වාර්තා	22877	8092	23389	11036	5243	5046
ඉඩම් අත්කර ගැනීම්	16476	15639	20045	21280	19454	20086
ඉඩම් ඇස්තමේන්තු	1243	648	1032	1471	970	521
ඉඩම් විවිධ	48174	33222	41987	56931	46198	29872
කුලී පුද්ගලික	6067	7619	8912	11149	9184	7896
කුලී රජය	4521	4094	4132	4230	5949	4262



* මුද්දර බදු සහ අල්ලස් කොමසාරිස් වෙත වාර්තා පෙන්නුම් කර නොමැත.

8. ඉලක්කගත - නිම කළ - ප්‍රක්ෂේපිත සාමාන්‍ය තක්සේරු කිරීම්

	2018 ඉලක්කගත	2018 නිම කළ
තත්ත්ව වාර්තා	6245	5243
ඉඩම් අත්කර ගැනීම්	18107	19454
ඉඩම් ඇස්තමේන්තු	759	970
ඉඩම් විවිධ	33295	46198
කුලී පුද්ගලික	8250	9184
කුලී රජය	5949	5949



9. වරිපනම් තක්සේරු

මහ නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා යටතේ ගැනෙන ඔවුන්ගේ ප්‍රාදේශීක බදු අයකර ගැනීමට ඔවුනට හැකි වනු පිණිස දේපළ 194,623 ක මූලික සමීක්ෂණ ද,දේපළ 215,071 ක අවසන් පරීක්ෂණ ද, විශේෂ දේපළ 1,112 ක අවසන් පරීක්ෂණ ද සම්පූර්ණ කරමින් සැලකිය යුතු ප්‍රමාණයක් වූ දේපළ ගණනාවක වරිපනම් තක්සේරු කටයුතු නිමකර දීමට 2018 වසර තුළ දී දෙපාර්තමේන්තුවට හැකි විය.

ප්‍රති වරිපනම් - 2018 ඉලක්ක ගත < 2018 නිම කළ >2019 ප්‍රක්ෂේපිත



ප්‍රති වරිපනම් තක්සේරු කටයුතු – වසරමය සහ ප්‍රක්ෂේපිත

	2014	2015	2016	2017	2018	2019
මූලික සමීක්ෂණ	184675	119539	173619	183632	194623	363425
අවසන් පරීක්ෂණ	180548	150455	166155	194527	215071	360283



10. වරිපනම් ආශ්‍රිත තක්සේරු කටයුතු

2018 වසර තුළ, ඉඩම් ප්‍රතිවරිපනම් තක්සේරු 30,919 ක් වූ ප්‍රමාණයක්ද, ගොඩනැගිලි ප්‍රතිවරිපනම් තක්සේරු 1,596ක් වූ ප්‍රමාණයක් ද, ඒකක 4,870 ක් සඳහා වූ ප්‍රතිවරිපනම් තක්සේරු විරෝධතා ප්‍රමාණයක් ද සම්පූර්ණ කිරීමට දෙපාර්තමේන්තුව සමත් විය.



වරිපනම් තක්සේරු ආශ්‍රිත කටයුතු - ඉලක්කගත - නිම කළ - ප්‍රක්ෂේපිත

	2018 ඉලක්කගත	2018 නිම කළ	2019 ප්‍රක්ෂේපිත
ඉඩම් ප්‍රතිවරිපනම් තක්සේරු	25555	30919	25475
ගොඩනැගිලි ප්‍රතිවරිපනම් තක්සේරු	1715	1596	1655
වරිපනම් තක්සේරු විරෝධතා	4966	4870	5215



ඉඩම් අත්කර ගැනීමේ සමාලෝචන මණ්ඩලයේ කටයුතු පිළිබඳ ලුහුඩු විස්තරය

අනිවාර්ය දේපළ අත් කර ගැනීම යටතේ වන්දි මුදල් ප්‍රමාණවත් වන බවට සෑහීමට නොපත් පාර්ශවයන් විසින් ඉදිරිපත් කරනු ලබන අභියාචනා විභාග කිරීමේ කාර්යය සඳහා 1950 අංක 09 දරන ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ ස්ථාපිත ඉඩම් අත්කර ගැනීමේ සමාලෝචන මණ්ඩලය වෙත දෙපාර්තමේන්තුවේ නීති අංශය සහය සළසා දෙයි.

අභියාචනා කළමනාකරණ කටයුතු ඉඩම් අත්කර ගැනීමේ සමාලෝචන මණ්ඩලය

	2014	2015	2016	2017	2018
වසර මුල ඉතිරිය	978	2216	178	179	236
වසර තුළ ලද සංඛ්‍යාව	429	558	215	92	293
විභාග කළ මුළු සංඛ්‍යාව	1486	2333	1407	393	529



වසර තුළ ඉඩම් අත්කර ගැනීමේ සමාලෝචන මණ්ඩලය විසින් මෙහෙයවන ලද අභියාචනා වල සම්පිණ්ඩනය

අභියාචනා වර්ගය	ලද ගණන	විභාග කළ
ඉඩම් අත්කර ගැනීමේ සමාලෝචන මණ්ඩලය	529	236
අභියාචනාධිකරණය ඉදිරියේ දී කටයුතු කරන ලද අභියාචනා	11	1
මානව හිමිකම් කොමිෂන් සභාව ඉදිරියේ දී කටයුතු කරන ලද අභියාචනා	4	0
දිසා අධිකරණ ඉදිරියේ දී කටයුතු කරන ලද අභියාචනා	35	0

11. වත්කම් අංශයේ තක්සේරු කටයුතු පිළිබඳ ලුහුඩු විස්තරය

රජයේ අයිතිය යටතේ පවත්නා සියලුම නිශ්චල දේපළ තක්සේරු කිරීමේ කාර්ය භාරය තක්සේරු දෙපාර්තමේන්තුව වෙත පවරා දෙනු ලැබ ඇති අතර එම ක්‍රියාදාමය ඒ සඳහාම ස්ථාපනය කළ රාජ්‍ය වත්කම් තක්සේරු කිරීමේ ඒකකය මගින් කඩිනම් ව්‍යාපෘතියක් ලෙස අතිරේක කාර්ය මණ්ඩල ද බඳවා ගනිමින් ඔවුන්ගේ ද සහය ඇතිව ඉටු කරනු ලැබේ. 2018 වර්ෂය තුළ දී, පහත දැක්වෙන කටයුතු දෙපාර්තමේන්තුව විසින් ඉටු කරනු ලැබ ඇත.

- අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු 33 කට අයත් රාජ්‍ය වත්කම් තක්සේරුවලට අදාළ ලිපි ගොනු 450 ක කටයුතු ඉටු කරන ලද අතර ඉන් ලිපි ගොනු 350 ක් යටතේ මුළු දේපළ ඒකක 3,350 කට අදාළ වත්කම් තක්සේරු කිරීමේ කටයුතු දෙපාර්තමේන්තුව විසින් වසර තුළදී සාර්ථක ලෙස සපුරා ගන්නා ලදි.

- සංස්ථාගත ආයතන 6 කට අයත් ආයතනික වත්කම් තක්සේරු කිරීමේ කටයුතු වලට අදාළ ලිපි ගොනු 78 ක කටයුතු ද, ඉන් ලිපි ගොනු 55 ක් යටතේ මුළු දේපළ ඒකක 658 කට අදාළ වත්කම් තක්සේරු කිරීමේ කටයුතු ද දෙපාර්තමේන්තුව විසින් 2018 වසර තුළ දී විධිමත් පරිදි ඉටු කරන ලදි.

12. තක්සේරු දෙපාර්තමේන්තුව විසින් 2018 වසර තුල ඉටු කරන ලද විශේෂ ව්‍යාපෘති වල සාරාංශය

මෑත වර්ෂ කිහිපය තුළ ශ්‍රී ලංකාවේ රාෂ්ටීය සන්දර්භය තුළ සිදුවූ වෙනස්කම් බොහෝය. රාජ්‍ය ප්‍රතිපත්ති වලට හා ආර්ථික ප්‍රතිසංස්කරණ වලට අනුගත වෙමින් රටේ ආර්ථික ප්‍රවර්ධනය සඳහා රජය විසින් විවිධ සංවර්ධන ව්‍යාපෘති ආරම්භ කර ඇත. එම සංවර්ධන ක්‍රියාවලිය බාධා විරහිතව ක්‍රියාවට නැංවීම පිණිස ශ්‍රී ලංකා රජය වෙත පරිපූර්ණ අධි වෘත්තීයමය තක්සේරුකරණ හා දේපළ කළමනාකරණ සේවා මහ පරිමාණ වශයෙන් සලසා දීම අරබයා තක්සේරු දෙපාර්තමේන්තුව සම්බන්ධ වූ ප්‍රධාන සංවර්ධන වැඩසටහන් අතර දිවයින පුරා විවිධ විශේෂ අංශ ආශ්‍රිතව බිහිවූ ව්‍යාපාරික හා තාක්ෂණික සංවර්ධන ප්‍රදේශ, ජාතික ආර්ථිකය හා ජාතික ප්‍රවාහන පද්ධතිය දියුණු කිරීම සඳහා වූ මහා මාර්ග ව්‍යාපෘති මෙන්ම සංචාරක කලාපවල සිදුකරන ලද සංවර්ධන කටයුතු ද වුයේය. තක්සේරු දෙපාර්තමේන්තුව මෙම විශේෂ ව්‍යාපෘතිවලට අයත් සියලුම ඉඩම් කැබලි හා සම්බන්ධ ඉඩම් අත්කර ගැනීමේ හා ප්‍රතිස්ථාපනය කිරීමේ කමිටු රැස්වීම් වලට සහභාගි වූ අතර එම දේපළවල තක්සේරු කටයුතු දෙපාර්තමේන්තුව විසින් ඉටු කරනු ලැබ ඇත. ඉඩම් අත්කර ගැනීමේ හා ප්‍රතිස්ථාපනය කිරීමේ කමිටු රැස්වීම් වලදී පැන නැගි ආරවුල් සහිත දේපළ ගැටලු නිරාකරණය සඳහා වූ විශේෂ රැස්වීම් වලට ද දෙපාර්තමේන්තුව සහභාගි විය.

2018 වසර තුළ පවරන ලද විශේෂ ව්‍යාපෘති

අංකය	වගකිව යුතු පළාත්බද නිලධාරීන්	ව්‍යාපෘති
1	කොළඹ නගරය	නව කැළණිපාලම ඉදිකිරීමේ ව්‍යාපෘතිය
		ඕරුගොඩවත්ත අඹතලේ මාර්ග ව්‍යාපෘතිය
		කොළඹ - හොරණ මාර්ගය
		කිරුළපන - ගොඩගම මාර්ගය
		වේරුස්ගහ සංවර්ධන ව්‍යාපෘතිය
		ශාන්ත සෙබස්තියන් උතුරු ඇල සංවර්ධන ව්‍යාපෘතිය
		කොම්පඤ්ඤ වීදිය ප්‍රතිසංවර්ධන ව්‍යාපෘතිය
		මට්ටක්කුලිය පාලම සංවර්ධන ව්‍යාපෘතිය
		රාජගිරිය ගුවන් පාලම් ව්‍යාපෘතිය
		මැරයින් ඩ්‍රයිව් මාර්ග ව්‍යාපෘතිය
		ඕරුගොඩවත්ත අඹතලේ මාර්ග ව්‍යාපෘතිය
		ශ්‍රී ජයවර්ධන පුර - කොල්ලුපිටිය මාර්ගය
		නාරාහේන්පිට නුගේගොඩ පාලම
		දෙහිවල - අත්තිඩිය මාර්ගය
		වටරප්පල මාර්ගය
		නව කැළණිපාලමේ සිට රාජගිරිය දක්වා ගුවන් පාලම් මාර්ගය
2	බටහිර මධ්‍යම	වේරුස්ගහ ව්‍යාපෘතිය
		කොට්ටාව - තලගලමාර්ගය
		කිරුළපන ගොඩගම මාර්ගය
		කෝට්ටේ - බෝපේ මාර්ගය
		වල්ගම - දියගම මාර්ගය (ඔපෙක් 2 ව්‍යාපෘතිය)
		6/1 පාලම (කොට්ටාව)
		කොට්ටාව - පින්හේන මාර්ගය
		කොට්ටාව - පන්නිපිටිය මාර්ගය
		තලගල - මොරගහහේන මාර්ගය
		සොයිසාපාර
		රොබර්ට් ගුණවර්ධන මාවත
		කඩුවෙල - අතුරුගිරිය මාර්ගය
		වල්ගම - අතුරුගිරිය මාර්ගය (ඔපෙක් 3 ව්‍යාපෘතිය)
		පාර්ලිමේන්තු ගංඉවුර
		පැලවත්ත - අකුරුගොඩ මාර්ගය

		පිළියන්දල - මහරගම මාර්ගය (ඔපෙක් 2 ව්‍යාපෘතිය)
		මාකුඹුර - මාහේනවත්ත නව යෝජිත ව්‍යාපෘතිය
		කැළණිමුල්ල කොස්වත්ත මාර්ග ව්‍යාපෘතිය
3	බටහිර උතුර	මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය
		කැළණිය - මුදුන්ගොඩ මාර්ගය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය
4	බටහිර දකුණ	හොරණ - අඟුරුවාතොට - අලුත්ගම
		පොකුණුවිට - කෝරළඉම මාර්ගය
		කළුවැල්ල - බැල්ලපිටිය මාර්ගය
		වාද්දූව - මොරොන්තුඩුව මාර්ගය
		කොට්ටාව - තලගල මාර්ගය
		බෙල්ලන - මොරගල මාර්ගය
		රුවන්පුර අධිවේගී මාර්ගය
5	දකුණ	මාතර - හක්මන මාර්ගය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය
		මොරගොඩ ඇල
		දක්ෂිණ අධිවේගී මාර්ගය
		ගාල්ල බද්දේගම මාර්ගය
		හම්බන්තොට ගන්නොරුව මාර්ගය
		මිරිජ්ජවිල සූරියවැව මාර්ග ව්‍යාපෘතිය
		වලස්මුල්ල නගර සංවර්ධන ව්‍යාපෘතිය
		වීරකැටිය නගර සංවර්ධන ව්‍යාපෘතිය
		තිහගොඩ - කඹුරුපිටිය / මාවරල - කොටපොළ ව්‍යාපෘතිය
6	මධ්‍යම- I	මධ්‍යම අධිවේගී මාර්ගය
		A9 මාර්ගය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය
		විලියම් ගොපල්ලව මාවත
		පේරාදෙණිය - බදුල්ල - චෙන්කලඩි මාර්ගය
		මහනුවර - කිරිමැටිය මාර්ගය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය
		පේරාදෙණිය - හල්ලොලුව මාර්ගය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය
		මොරගොල්ල - ජල විදුලි ව්‍යාපෘතිය
		මීපේඇල වම් ඉවුර ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය
7	මධ්‍යම- II	මොරගහකන්ද සහ කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය
		වයඹ පළාත් ගංගා ව්‍යාපෘතිය
		මහනුවර - යාපනය මාර්ගය
		තල්ගොඩපිටිය - දොඹවල මාර්ගය
		රත්තොට - ඉලුක්කුඹුර මාර්ගය
		මධ්‍යම අධිවේගී මාර්ගය

		නකල්ස් සංරක්ෂණ ව්‍යාපෘතිය
8	උතුරුමැද	මැදිරිගිරිය - කන්තලේ මාර්ගය
		මැදිරිගිරිය ජාත්‍යන්තර ක්‍රීඩා භූමිය
		මල්වතු ඔය ව්‍යාපෘතිය
		යාන් ඔය ව්‍යාපෘතිය
		මදුරන්කඩවල - මඩකළපුව මාර්ගය
		පොළොන්නරුව නව නගරය
		පොළොන්නරුව වට රවුම
		කදුරුවෙල නව වෙළෙඳ මධ්‍යස්ථානය
9	වයඹ	මධ්‍යම අධිවේගී මාර්ගය (II,III,IV කොටස්)
		දැදුරු ඔය ජල විදුලි ව්‍යාපෘතිය
		අඹයපුස්ස - කුරුණෑගල - ත්‍රිකුණාමලය මාර්ග ව්‍යාපෘතිය
		වයඹ ගංගා ව්‍යාපෘතිය
		දඹුල්ල දුම්රිය පොළ මාර්ගය
10	සබරගමුව	මධ්‍යම අධිවේගී මාර්ගය
		ඇහැලියගොඩ - දෙහිඕවිට මාර්ගය
		දැරණියගල - දෙහිඕවිට මාර්ගය
		රත්නපුර ප්‍රතිවිරුද්ධ මාර්ගය
		මහවැලි අධිකාරියේ ඉඩම
		රුවන්පුර අධිවේගී මාර්ගය
11	ඌව	ලුණුගම්වෙහෙර බෙරලියෙල කතරගම මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය
		බදුල්ල - චෙන්කලඩි මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය
		උමාඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය
		මොණරාගල ජල විදුලි ව්‍යාපෘතිය
		බදුල්ල - හාලිඇල - ඇල්ල ජලවිදුලි ව්‍යාපෘතිය
		බදුල්ල ස්ප්‍රිංවැලි මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය
12	උතුර	AB31 මාර්ගය
		කරෙයිනගර් - යාපනය මාර්ගය
		වවුනියා ජල සම්පාදන රක්ෂිත ව්‍යාපෘතිය
13	නැගෙනහිර	කින්නියා - තඹලගමුව මාර්ගය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය
		යාන් ඔය ජලාශ ව්‍යාපෘතිය
		පේරාදෙණිය - චෙන්කලඩි මාර්ගය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය
		රඹුක්කන් ඔය ජලවිදුලි ව්‍යාපෘතිය

13. අධ්‍යාපනික උන්නතිය

දැනුම, ආකල්ප හා කාර්යක්ෂමතාවය තේමාකර ගනිමින් සහ තිර ජීවන අධ්‍යාපනය තුළින් (Life Long Learning) සේවක අභිමානය යන මූලධර්මයත්, අභිප්‍රේරණය, කාර්ය සාධනය ඇගයීම සහ කුසලතා සංවර්ධනය තුළින් සේවක කාර්යක්ෂමතාව හා කැපවීම යන මූලධර්මයත් සැලකිල්ලට ගනිමින් 2006 වසරේදී නිපුණතා සංවර්ධන කේන්ද්‍රය ස්ථාපනය කරන ලදී. තක්සේරු දෙපර්තමේන්තුව තුළ නිපුණතා සංවර්ධන කේන්ද්‍රය පිහිටුවා ඇත්තේ එහි සියලුම කාර්ය මණ්ඩලවල දැනුම වර්ධනය කිරීමේ පුළුල් පරමාර්ථයෙනි. මෙම නිපුණතා සංවර්ධන හා පුහුණු කේන්ද්‍රය තක්සේරු දෙපාර්තමේන්තුවේ ආරම්භයත් සමගම පුහුණු පාසලක් වශයෙන් බිහිවු එකකි. පුහුණුව ආශ්‍රිත ක්ෂේත්‍රයෙහි ඉල්ලුම ක්‍රමයෙන් වර්ධනය වීම නිසා ඊට අදාළ සංකල්ප වෙනස් කිරීම් වලට භාජනය කෙරුණු අතර මෙම පුහුණු පාසල නව ප්‍රවනතා වලට ප්‍රතිචාර දක්වන නවෝත්පාදක වැඩසටහන් ඉදිරිපත් කරන්නාවූ විද්‍යායතනයක් බවට පත්විය. පසුගිය වසර කීපය මුළුල්ලේ මෙම විද්‍යායතනය මූල්‍යමය වශයෙන් ලාභදායි හා ලාභදායි නොවන පුහුණු වැඩසටහන් ගණනාවක් දෙපාර්තමේන්තුවේ ඉහළ මට්ටමේ සිට පහළ මට්ටම දක්වා වූ කළමනාරණය වෙත ද, බාහිර පර්ශවයන් වෙත ද දියත් කර හරිනු ලැබ තිබේ.

දෙපාර්තමේන්තුවේ ඉහළ කළමනාකරණයේ සිට සහයක ශ්‍රේණිවල කාර්ය මණ්ඩලය දක්වා විහිදී යන පරිදි දෙපාර්තමේන්තුවේ නිලධාරින්ගේ දැනුම ආකල්ප හා කර්යක්ෂමතාව වර්ධනය කිරීම තුළින් වෘත්තීය විශිෂ්ඨත්වය ලඟාකර ගැනීමේ අරමුණු පෙරදැරි කරගෙන නිපුණතා සංවර්ධන කේන්ද්‍රය විසින් පුහුණු වැඩසටහන් සංවිධානය හා මෙහෙයවීම සිදු කරයි.

නිපුණතා සංවර්ධනය කේන්ද්‍රය විසින් මෙහෙයවනු ලබන පුහුණු වැඩසටහන් ප්‍රධාන අංශ දෙකක් යටතේ පහත සඳහන් පරිදි වර්ගීකරණය කළ හැකිය.

- අභ්‍යන්තර නිලධාරීන් සඳහා අභන්තර හා බාහිර පුහුණු වැඩසටහන් -
    - රැකියා නැඹුරුවක් සහිත පුහුණු වැඩසහන්
    - විෂය කේන්ද්‍රකොට ගත් පුහුණු වැඩසටහන් හා වැඩමුළු
    - විභාග ඉලක්ක කොටගත් පුහුණු සැසි හා වැඩමුළු
    - දැනුම හුවමාරු කර ගැනීමේ වැඩමුළු
    - ධනාත්මක ආකල්ප සහ ඵලදායිතා සැසි
- බාහිර නිලධාරීන් සඳහා අභ්‍යන්තර පුහුණු වැඩසටහන් -
    - පළාත් පාලන නිලධාරින් සඳහා පුහුණු සැසිවාර
    - පළාත් ආදායම් නිලධාරින් සඳහා පුහුණු සැසිවාර හා වැඩමුළු
    - දේපළ කළමනාකරණය හා තක්සේරුකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධි අපේක්ෂකයන් සඳහා වෘත්තීය අනුබද්ධ වැඩසටහන්
    - අත්කර ගැනීමේ නිලධාරින් සඳහා වන වැඩමුළු හා පුහුණු සැසිවාර
    - අවශ්‍යතා අනුව විශේෂයන්ම සැකසුණු පුහුණු වැඩසටහන්

2018 වසර තුළ, මුළු වශයෙන් පුහුණු වැඩසටහන් 24 ක් ඊට සහභාගිවන්නන් 478 දෙනෙකු සඳහා ක්‍රියාත්මක කෙරුණි. සියලුම මට්ටමේ තනතුරු ආවරණය වන පරිදි අභ්‍යන්තර නිලධාරීන් සඳහා අභ්‍යන්තර හා බාහිර පුහුණු වැඩසටහන් 23 ක් පවත්වන ලද අතර මූලික ක්ෂේත්‍ර පරීක්ෂණය ආරම්භ කිරීමේ සිට තක්සේරු වාර්තාව පිළියෙළ කිරීම දක්වා වන න්‍යායාත්මක මෙන්ම ප්‍රායෝගික ක්‍රියාවලිය ආවරණය වන පරිදි දින 10 ක කාලයක් තුළ පැවැති අදාළ අවශ්‍යතාව සඳහාම සැකසුණු වැඩසටහනක් උපාධි අපේක්ෂකයින් 52 දෙනෙකුගේ සහභාගිත්වයෙන් ක්‍රියාත්මක විය.

III වන කොටස - මූල්‍යමය කාර්යකරණය සහ විශ්ලේෂණය

14. මූල්‍යමය කාර්යකරණය මැනීම සහ වාර්තාකරණය

	2014	2015	2016	2017	2018
සත්‍ය ගාස්තු	රු. 101,280,582.00	රු. 53,047,155.00	රු. 132,085,894.53	රු. 164,110,234.13	**142,902,142.00**
කල්පිත ගාස්තු	රු. 30,000,000.00	රු. 60,000,000.00	රු. 60,000,000.00	රු. 75,000,000.00	**80,000,000.00**



වැය ශීර්ෂය	විස්තරය	2018 වෙන් කිරීම	මුළු වියදම	2018.12.21 ඉතුරුම්	වියදම් ප්‍රතිශතය	ඉතුරුම් ප්‍රතිශතය
	පුනරාවර්තන වියදම්	420,270,000.00	376,413,220.34	15,906,779.66	96	4
	පුද්ගල පඩිනඩි	**333,500,000.00**	**286,950,008.55**	**9,999,991.45**	97	**3**
1001	වැටුප් හා වේතන	200,000,000.00	205,947,204.10	902,795.90	100	0
1002	අතිකාල හා වෙනත් දීමනා	3,500,000.00	5,973,366.45	26,633.55	100	0
1003	වෙනත් දීමනා	130,000,000.00	75,029,438.00	9,070,562.00	89	11
	ප්‍රවාහන වියදම්	**18,000,000.00**	**17,630,352.10**	**369,647.90**	**98**	**2**
1101	දේශීය	15,000,000.00	14,984,949.92	15,050.08	100	0
1102	විදේශීය	3,000,000.00	2,645,402.18	354,597.82	88	12
	සැපයුම්	**8,550,000.00**	**8,967,822.04**	**482,177.96**	95	**5**
1201	ලිපි ද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා	4,500,000.00	4,811,612.24	188,387.76	96	4
1202	ඉන්ධන	3,500,000.00	3,619,000.80	280,999.20	93	7
1203	ආහාර හා නිල ඇඳුම්	550,000.00	537,209.00	12,791.00	98	2
	නඩත්තු වියදම්	**5,200,000.00**	**4,183,264.11**	**1,516,735.89**	**73**	**27**
1301	වාහන	4,000,000.00	3,121,672.60	878,327.40	78	22
1302	දේපළ, පිරියත හා උපකරණ	700,000.00	952,331.51	247,668.49	79	21
1303	ගොඩනැගිලි හා ව්‍යුහ	500,000.00	109,260.00	390,740.00	22	78
	සේවා	**46,020,000.00**	**49,301,974.30**	**3,518,025.70**	**93**	**7**
1401	ප්‍රවාහන	2,200,000.00	2,380,798.00	819,202.00	74	26
1402	තැපැල් හා සන්නිවේදන	4,500,000.00	4,737,225.99	12,774.01	100	0
1403	විදුලි හා ජල	8,500,000.00	8,411,434.48	88,565.52	99	1
1404	කුලී හා දේශීය බදු	13,500,000.00	16,811,679.32	238,320.68	99	1
1408	මෙහෙයුම් කල්බදුකර මත සපයා ගත් කල්බදු කුලී වාහන	10,320,000.00	8,758,860.00	1,561,140.00	85	15
1409	වෙනත්	7,000,000.00	8,201,976.51	798,023.49	91	9
	පැවරුම්	**9,000,000.00**	**9,379,799.24**	**20,200.76**	**100**	**0**
1506	රජයේ සේවකයින් සඳහා දේපළ ණය පොළී	9,000,000.00	9,379,799.24	20,200.76	100	0
	ප්‍රාග්ධන වියදම්	386,700,000.00	142,565,034.59	272,084,965.41	34	66
	ප්‍රාග්ධන වත්කම් පුනරුත්තාපනය හා වැඩි දියුණු කිරීම	**12,000,000.00**	**8,537,730.97**	**3,462,269.03**	**71**	**29**
2001	ගොඩනැගිලි හා ව්‍යුහ	8,800,000.00	6,791,364.80	2,008,635.20	77	23
2002	දේපළ, පිරියත හා උපකරණ	1,500,000.00	767,151.06	732,848.94	51	49
2003	වාහන	1,700,000.00	979,215.11	720,784.89	58	42
	ප්‍රාග්ධන වත්කම් අත්කර ගැනීම	**4,200,000.00**	**8,240,522.05**	**23,409,477.95**	26	**74**
2102	ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ	2,200,000.00	2,617,153.68	32,846.32	99	1
2103	දේපළ, පිරියත හා උපකරණ	2,000,000.00	5,623,368.37	23,376,631.63	19	81
	ධාරිතා වර්ධනය	**11,500,000.00**	**11,158,781.57**	**841,218.43**	**93**	**7**
2401	**කාර්ය මණ්ඩල පුහුණු**	11,500,000.00	11,158,781.57	841,218.43	93	7
	රජයේ දේපළ තක්සේරු කිරීම	**1,000,000.00**	**-**	**1,000,000.00**	-	**100**
2509	වෙනත්	1,000,000.00	-	1,000,000.00	-	100
	රජයට පවරාගත් ආයතන සඳහා වන්දි	**358,000,000.00**	**114,628,000.00**	**243,372,000.00**	**32**	**68**
	ඌණ කාර්යසාධනයක් සහිත ව්‍යවසාය හා වත්කම්					
2501	ප්‍රතිව්‍යුහගතකරණය	358,000,000.00	114,628,000.00	243,372,000.00	32	68
	මුළු වියදම්	806,970,000.00	518,978,254.93	287,991,745.07	64	**36**

IV වන කොටස - අනුමත සේවක සංඛ්‍යාව හා ශ්‍රම සම්පත

15. 2018 දෙසැම්බර් මස 31 වන දිනට සේවක *සංඛ්‍යාව*

(අනුමත සේවක සංඛ්‍යාව / දැනට සිටින සේවක සංඛ්‍යාව)	අනුමත සේවක සංඛ්‍යාව-නව	දැනට සිටින සේවක සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව
රජයේ ප්‍රධාන තක්සේරුකරු	01	01	00
අතිරේක ප්‍රධාන තක්සේරුකරු	04	01	03
නියෝජ්‍ය ප්‍රධාන තක්සේරුකරු /පළාත් තක්සේරුකරු	16	01	15
අධ්‍යක්ෂ (පරිපාලන)	01	00	01
ප්‍රධාන ගණකාධිකාරී	01	01	00
ප්‍රධාන අභ්‍යන්තර විගණක	01	01	00
ගණකාධිකාරී	01	00	01
ජ්‍යෙෂ්ඨ තක්සේරුකරු / දිස්ත්‍රික් තක්සේරුකරු	80	15	65
තක්සේරුකරු /සහකාර දිස්ත්‍රික් තක්සේරුකරු	120	21	99
නීති නිලධාරී	02	01	01
පරිපාලන නිලධාරී	02	01	01
තොරතුරු හා සන්නිවේදන නිලධාරී	02	00	02
භාෂා පරිවර්තක (සිංහල - දෙමළ)	01	00	01
සහකාර තක්සේරුකරු / සහකාර දිස්ත්‍රික් තක්සේරුකරු	360	315	45
සංවර්ධන නිලධාරී	25	27	+02
තොරතුරු හා සන්නිවේදන සහකාර	03	00	03
රාජ්‍ය කළමනාකරණ සහකාර	103	95	08
රියදුරු	18	19	+01
කාර්යාල කාර්ය සහායක	74	67	07
සංචාරක බංගලා භාරකරු	04	01	03

නිම කිරීම

රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව මෙරට ප්‍රගමනයට හා සංවර්ධනයට සෘජු දායකත්වයක් සපයන රාජ්‍ය ආයතනවලින් එකක් බව පොදු මහජනතාව විෂයෙහි ප්‍රකටව මුල් බැසගත් කරුණකි. ගොඩනැගිලි, නිවාස හා දේපළ වෙළෙඳපොළ පිළිබඳව පුළුල් හා අත්දැකීම් සහිත අධි වෘත්තීය තක්සේරුකරුවා සංවර්ධනයේ කොටස් කරුවකු වන්නේ ය. රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවේ රාජකාරිය දේපළ තක්සේරු කිරීමට පමණක් සීමා වූවක් නොවේ. තක්සේරුකරණය, දේපළ කළමනාකරණය හා දේපළ අත්කර ගැනීම සම්බන්ධයෙන් පළාත් පාලන ආයතන හා පළාත් සභා වැනි රාජ්‍ය ආයතනවලට සහ අර්ධ රාජ්‍ය ආයතනවලට අදාළ පරිදි නීති උපදෙස් සැපයීම ද ඉන් සිදු කරයි.

මෙම වාර්තාව අප දෙපාර්තමේන්තුවේ අරමුණු, ඉදිරි දැක්ම සහ මෙහෙවර මනාව පිළිබිඹු කරන විධිමත් ලේඛනයයි. 2017 වර්ෂයට වඩා විශාල ප්‍රමාණයේ වැඩ ධාරිතාවක් සාක්ෂාත් කර ගැනීම උදෙසා අපගේ මානව හා භෞතික සම්පත දායකකර දුන් ශක්තියත්, අප දැරූ සාමූහික ප්‍රයත්නය ආශ්‍රිත උපාය මාර්ගික කාර්ය සාධනයත් ඊට සාක්ෂි දරයි.

අපගේ අපේක්ෂිත ඉලක්ක ලඟා කර ගැනීම සඳහා ශ්‍රී ලංකා ජන රජයේ අතිගරු ජනාධිපතිතුමන් ද, ගරු මුදල් අමාත්‍යතුමන් ද, ගරු මුදල් නියෝජ්‍ය අමාත්‍යතුමන් ද, ගරු මුදල් රාජ්‍ය අමාත්‍ය තුමන් ද, මහා භාණ්ඩාගාරයේ ලේකම්තුමා හා මුදල් අමාත්‍යාංශයේ කාර්යමණ්ඩලය ද විසින් මා වෙත හා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත දක්වන ලද සහයෝගය මම ඉතා කෘතඥා පූර්වකව සිහි කරමි.

අපගේ සේවදායකයන් සමඟ සහයෝගයෙන් ඉලක්කගත කාර්යයන් සාර්ථකව ඉටුකර ගැනීම සඳහා වෙහෙස නොබලා කැපවෙමින් ඉතා ඉහළ මට්ටමේ උනන්දුවක් සහිතව සිය සේවාවන්හි නියැලි තක්සේරු දෙපාර්තමේන්තුවේ සියලුම කාර්ය මණ්ඩලයට මාගේ හෘදයාංගම ස්තූතිය පළ කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි. මෙරට සංවර්ධනය උදෙසා කැපවී කටයුතු කරන අතරම, තමන් සතු සීමිත සම්පත් යොදා ගනිමින් සේවාමය වශයෙන් ස්වකීය පූර්ණ සානුබලය රජය වෙත සලසා දීමට දෙපාර්තමේන්තුව සිය උපරිම ප්‍රයත්නය දරයි. විශිෂ්ට අනාගත කාර්යභාරයක් අපේක්ෂා කරන තක්සේරු දෙපාර්තමේන්තුවට එම කටයුතු සාර්ථකව මුදුන් පමුණුවා ගත හැකි වේවා යනුවෙන් මම මාගේ සුභාසිංශන මෙයින් ඊට පිරිනමන්නෙමි.

පී.ඩී.ඩී.එස්. මුතුකුමාරණ

රජයේ ප්‍රධාන තක්සේරුකරු